ගම්පොළ නගර සභාව - 2024

----

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ගම්පොල නගර සභාවේ 2024 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන නගර සභා ආඥා පනතේ (255 අධිකාරය) 181(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10(1) උපවගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2024 දෙසැම්බර් 31 දිනට ගම්පොළ නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

නගර සභාවේ මූල්‍ය වර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගැයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, නගර සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතී,රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳව වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට පැවති රු.752,931 ක පුස්තකාල ස්ථාවර තැන්පතු මූල්‍ය ප්‍රකාශනයෙහි දක්වා නොතිබුණි.	ඉදිරියේ දි නිවැරදි කිරීමට කටයුතු කරන බව.	ගිණුම් නිවැරදිව පිළියෙල කළ යුතුය.
(ආ)	දේශීය ණය සංවර්ධන අරමුදලට අදාළව සභාව විසින් ගෙවිය යුතුව පවතින රු.38,073,118 ක හිඟ ණය පොළිය ගිණුම්ගත කර නොතිබුණි.	ඉදිරියේ දී ජ'නල් සටහන් මඟින් නිරූපණය කිරීමට කටයුතු කරන බව.	-එම-
(ඇ)	ජ'නල් අංක 77 හි දක්වා තිබුණු විවිධ ණයහිමියන්ගේ හර ශේෂවල එකතුව රු.354,628 ක් අඩුවෙන් ගණනය කර ගිණුම්ගත කර තිබුණි.	ජ'නල් සටහන් මඟින් නිවැරදි කිරීමට කටයුතු කරන බව.	-එම-
(ඈ)	සමාලෝචිත වර්ෂය තුළ ගෙවන ලද රු.561,686 ක වියදම් සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට විවිධ ණයහිමියන් යටතේ ගිණුම්ගත කර තිබුණි.	-එම-	-එම-
(ඉ)	ජ'නල් අංක 45 න් 2023 වර්ෂයේ ගැලපීම් නිවැරදි කිරීම ලෙස දක්වා දේශීය ණය හා සංවර්ධන අරමුදලට රු.163,813 ක් හර කර සමුච්චිත අරමුදලට බැර ලෙස දක්වා තිබුණු සටහන අවලංගු කර තිබිය දී, එම වටිනාකම දෝෂ සහගතව රු.163,813 ක් සමුච්චිත අරමුදලට බැර කර පසුව දේශීය ණය සහ සංවර්ධන අරමුදල ද හර කර තිබුණි.	-එම-	-එම-

1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

විගණන නිරීක්ෂණය		සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂය අවසාන දිනට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වත්කම් ඒකක 06 ක ශේෂයන් ඊට අදාළ උපලේඛන සමඟ සැසඳීමේ දී රු.84,545,686 ක නොසැසඳීමක් නිරීක්ෂණය විය.	කඩිනමින් නිවැරදි කිරීමට කටයුතු කරන බව.	ගිණුම් ශේෂ අදාල උපලේඛන සමඟ සැසඳෙන පරිදි නිවැරදි කළ යුතුය.
(ආ)	ස්ථාවර වත්කම් ශේෂය හා ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායක වීමේ ගිණුමේ ශේෂය අතර රු.115,740 ක වෙනසක් නිරීක්ෂණය විය.	ණය ශේෂ සොයාගත නොහැකි බව.	ස්ථාවර වත්කම් ශේෂය හා ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායක වීමේ ගිණුමේ ශේෂය සමාන විය යුතුය.

1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
ජ'නල් අංක 78 අනුව, ඉකුත් වර්ෂවල ණයහිමියන්ගේ අධි වෙන් කිරීම හා ඌන වෙන් කිරීම් ගැලපීම සඳහා රු.11,848,761 ක් සමුච්චිත අරමුදලට හා විවිධ ණයහිමියන්ට ගැලපීම් කර තිබුණ ද, එම ගැලපීමට අදාළ තොරතුරු විගණනයට ඉදිරිපත් නොවුණි.	ඉදිරියේ දී ණයහිමි ශේෂය නිවැරදි කිරීමට කටයුතු කරන බව.	සියලුම ගනුදෙනු සනාථ කරන සාක්ෂි විගණනයට ඉදිරිපත් කළ යුතුය.

1.7 අනුකූල නොවීම්

නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව	අනුකූල නොවීම	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ) පාර්ලිමේන්තු පනත්			
2021 ජුලි 08 දිනැති අංක 2235/54 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරී පනතේ 08 වන වගන්තිය සමඟ කියවිය යුතු ඒ පනතේ 21 වන වගන්තිය යටතේ සංශෝධිත සැලැසුම් හා ගොඩනැගිලි නියෝග VI කොටසේ 83.1 වගන්තිය	2020 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා කාලය තුළ අනුමත කරන ලද ගොඩනැගිලි අයදුම්පත් 226 ක් සඳහා අනුකූලතා සහතික නිකුත් කර නොතිබුණි.	ඉදිරි ක්‍රියාමාර්ග ගනු ලබන බව.	ගොඩනැගිලි පරීක්ෂා කර බලා අනුකූලතා සහතික නිකුත් කිරීම කළ යුතුය.

(ආ)	**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි**			
(i)	මු.රෙ. 571(3)	2017 වර්ෂයේ සිට 2024 දක්වා කාලයට අදාළ කාලය ඉකුත් වූ රු.1,714,543 ක තැන්පතු 87 ක් නිරවුල් කර නොතිබුණි.	ඉදිරි ක්‍රියාමාර්ග කඩිනමින් සිදු කරන බව.	කාලය ඉකුත් වූ තැන්පතු නිරවුල් කළ යුතුය.
(ii)	මු.රෙ. 486	වටිනාකම රු.556,853 ක් වූ චෙක්පත් 24 ක් අගරු වී තිබුණ ද, ඒ සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	104(3) පරීක්ෂණ මේ වන විට සිදු කරන බව.	කඩිනමින් අදාළ පරීක්ෂණ පවත්වා මුදල් අය කර ගැනීම කළ යුතුය.
(ඇ)	1987 සැප්තැම්බර් 30 දිනැති අංක 05/1/119 දරන නාගරික සංවර්ධන අධිකාරියේ සැලැසුම් චක්‍රලේඛ 08	නාගරික සංවර්ධන අධිකාරිය වෙනුවෙන් ආරම්භ කර ඇති ආයෝජන ගිණුමේ මුදල් නාගරික සංවර්ධන අධිකාරියෙන් විමසා ප්‍රාදේශීය සංවර්ධනයට යොදා ගත හැකි වුවත්, සමාලෝචිත වර්ෂය අවසාන දිනට පැවති රු.1,632,902 ක ශේෂයෙන් කිසිදු මුදලක් ප්‍රාදේශීය සංවර්ධනයට යොදා ගෙන නොතිබුණි.	අවශ්‍ය කටයුතු සිදු කරන බව.	ගිණුමේ මුදල් ප්‍රාදේශීය සංවර්ධනයට යොදා ගත යුතුය.
(ඈ)	**වෙනත් චක්‍රලේඛ**			
	1988 මැයි 17 දිනැති අංක 1988/22 දරන පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛය	වරිපනම් බදු අය කිරීමට අදාළ දේපළ වසර 05 කට වරක්වත් තක්සේරු කළ යුතු වුවත්, 2024 වර්ෂය සඳහා ද 2008 වර්ෂයේ සිදු කළ තක්සේරුව පදනම් කර ගෙන වරිපනම් අය කර තිබුණි.	තක්සේරු දෙපාර්තමේන්තුවට යොමු කර ඇති බව.	වසර 05 කට වරක් අදාළ දේපළ තක්සේරු කර වරිපනම් අය කළ යුතුය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.76,622,817 ක් වූ අතර, ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.67,273,302 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

		2024				2023			
	ආදායම් ප්‍රභවය	ඇස්තමේන්තු ගත ආදායම	බිල් කළ ආදායම	රැස්කළ ආදායම	දෙසැම්බර් 31 දිනට මුළු හිඟය	ඇස්තමේන්තුගත ආදායම	බිල් කළ ආදායම	රැස්කළ ආදායම	දෙසැම්බර් 31 දිනට මුළු හිඟය
		රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.
(i)	වරිපනම් හා බදු	34,205,500	34,334,628	30,679,761	64,371,059	32,505,500	33,362,197	31,601,307	60,716,192
(ii)	කුලී	62,249,400	39,958,548	48,715,835	91,647,326	45,870,000	28,270,288	22,474,868	100,404,613
(iii)	බලපත්‍ර ගාස්තු	4,201,300	7,407,590	6,321,840	2,695,812	3,950,000	3,685,664	3,737,664	1,610,062
(iv)	වෙනත් ආදායම්	127,025,500	83,013,208	106,332,556	50,788,249	132,447,200	51,464,626	43,504,763	74,107,597
		227,681,700	164,713,974	192,049,992	209,502,446	214,772,700	116,782,775	101,318,602	236,838,464

2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	**වරිපනම් හා බදු**		
(i)	**වරිපනම්**		
	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වරිපනම් හිඟය රු.63,355,277 ක් වූ අතර, එම හිඟය තුළ රු.10,000 ට වැඩි හිඟ පවතින වරිපනම් ඒකක 1741 කින් රු.37,287,464 ක් අය විය යුතුව තිබුණි. 1987 අංක 18 දරන නගර සභා ආඥා පනතේ (255 වන අධිකාරය) 170 වගන්තිය ප්‍රකාරව කටයුතු කර හිඟ ආදායම් අය කර නොතිබුණි.	හිඟ අය කර ගැනීමට කටයුතු කරන බව.	හිඟ ආදායම් කඩිනමින් අය කළ යුතුය.
(ii)	**ඉඩම් බදු**		
	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභා ඉඩම් බදු හිඟය රු.3,546,235 ක් වූ අතර, එම හිඟය තුළ රු.10,000 ට වැඩි හිඟ ඒකක 64 කින් රු.3,206,028 ක් ද අය කර ගෙන නොතිබුණි.	හිඟයෙන් 2025.05.23 දිනට රු.456,938 ක් අය කර ගෙන ඇති බව.	හිඟ ආදායම් කඩිනමින් අය කළ යුතුය.
(iii)	**විනෝද බදු**		
	සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දිනට රු.429,732 ක හිඟ ශේෂයක් පැවති අතර, සමාලෝචිත වර්ෂයේ බිල් කිරීම රු.423,821 ක් ද ලෙස එකතුව රු.853,553 ක් අය කර ගත යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.792,781 ක් අය කර ගෙන නොතිබුණි.	හිඟ මුදල් කඩිනමින් අය කර ගැනීමට කටයුතු කරන බව.	හිඟ ආදායම් කඩිනමින් අය කළ යුතුය.
(ආ)	**කඩ කුලී**		
(i)	සමාලෝචිත වර්ෂය අවසාන දිනට නගර සභාව සතු පොදු වෙළඳ පොළ සංකීර්ණ 05 ක කඩ කාමර 184 කින් එකතුව රු.34,186,000 ක කඩ කුලී අය කර නොතිබුණි.	හිඟ අය කර ගැනීමට කටයුතු කරන බව.	-එම-
(ii)	සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට සභාවට අයත් මස් කඩ 03 කින් හා මාළු කඩ 05 කින් එකතුව රු.1,742,217 ක කඩ කුලී අය කර නොතිබුණි.	-එම-	-එම -

(ඈ) **උසාවි දඩ හා මුද්දර ගාස්තු**

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරින්ගෙන් 2024 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.324,250 ක් හා මුද්දර ගාස්තු රු.40,136,100 ක් අය විය යුතුව තිබුණි.	හිඟ මුදලින් රු.79,000 ක් අය කර ගෙන ඇති බව.	-එම-

(ඇ) **වෙනත් ආදායම්**

(i) **ත්‍රීරෝද රථ ගාස්තු අය කිරීම**

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ත්‍රී රෝද රථ ගාස්තු හිඟ ශේෂය රු.5,266,058 ක් වූ අතර, එම හිඟය තුළ රු.10,000 ට වැඩි හිඟ පවතින ඒකක 225 කින් රු.2,883,000 ක් අය කර නොතිබුණි.	අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව.	-එම-

(ii) **තානායම් ගාස්තු**

2019 වර්ෂයේ සිට පැවත එන සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.7,807,021 ක් වූ හිඟ තානායම් ගාස්තු අය කිරීමට කටයුතු කර නොතිබුණි.	මේ වන විට කටයුතු සිදු කරමින් පවතින බව	හිඟ ආදායම් කඩිනමින් අය කළ යුතුය.

(iii) **දැන්වීම් පුවරු**

1988 අගෝස්තු 23 දිනැති අංක 520/07 දරන ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශයට පත් කරන ලද පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 39.1.2 ප්‍රකාරව, සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට රු.1,668,320 ක් අය කිරීමට කටයුතු කර නොතිබුණි.	-එම-	-එම-

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ගම්පොල ලංගම බස් නැවතුම් පොළ සාප්පු සංකීර්ණයේ බදුකරුවෙකුගෙන් සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට හිඟය රු.6,210,832 ක් අය කර ගෙන නොතිබුණි. එසේම, කඩ කාමර කුලී තක්සේරු වාර්තාවක් ලබා ගැනීමට 2022 මාර්තු 23 වන දින අංක 04:1:XIX දරන මහා සභා තීරණයක් ලබා දී තිබුණ ද, තක්සේරුව ඉල්ලුම් කිරීමට 2024 පෙබරවාරි 08 දින වන තෙක් ප්‍රමාද කර තිබුණි.	තක්සේරුව ඉල්ලුම් කිරීම ප්‍රමාද වූ බව.	ආදායම් අය කර ගැනීම කළ යුතු අතර නිලධාරීන්ගේ නොසැලකිල්ල සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය.

(ආ)	දුම්රිය දෙපාර්තමේන්තුවෙන් බද්දට ලබා ගෙන තිබුණු දේපළ සඳහා 2021 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසාන දින තෙක් එකතුව රු.4,739,175 ක බදු කුලී ගෙවා නොතිබුණි.	අවශ්‍ය ඉදිරි කටයුතු කඩිනමින් සිදු කරන බව.	ගෙවිය යුතු බදු කුලී නිරවුල් කිරීම කළ යුතුය.
(ඇ)	2016 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා රු.1,428,730 ක ගොඩනැගිලි අයදුම්පත් පරීක්ෂා කිරීමේ ගාස්තු ආදායමට බැර නොකර තැන්පතු ගිණුමේ රඳවා ගෙන තිබුණි.	-එම-	ආදායමට ගැනීම කළ යුතුය.
(ඈ)	සමාලෝචිත වර්ෂය අවසාන දිනට ස්ථාන මාරු වී ගිය, විශ්‍රාම ගිය හා සේවයෙන් ඉවත් වී ගිය සේවකයින් 31 දෙනෙකුගෙන් වසර 01 ත් 05 ත් අතර කාලයක සිට රු.1,406,220 ක ශේෂයක් අය කර ගෙන නොතිබුණි.	ඉදිරියේ දී අය කර ගැනීමට කටයුතු කරන බව.	සේවක ණය ශේෂ නිරවුල් කර ගැනීමට ක්‍රියා කළ යුතුය.
(ඉ)	2020 සැප්තැම්බර් 28 දිනැති අංක 2020/06 දරන පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛය අනුව, සභාවේ අතිරික්ත මුදල සභාවට ආදායම් උත්පාදනය සිදු කළ හැකි ආකාරයේ ව්‍යාපෘතිවල, දේපළ සංවර්ධනය කිරීම හෝ බහුතර ජනතාවට පොදු පහසුකම් සැපයීමේ ව්‍යාපෘතිවල ආයෝජනය කළ යුතු වුවත්, එසේ කිරීමකින් තොරව ස්ථාවර තැන්පතුවල රු.143,094,019 ක් ද, ඉතිරි කිරීමේ ගිණුමේ රු.21,169,252 ක් ද, ජංගම ගිණුමේ රු.155,519,856 ක ශේෂයක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවතුණි.	කටයුතු කරමින් පවතින බව.	චක්‍රලේඛයේ දක්වා ඇති අරමුණු ඉටුවන ආකාරයට යෙදවිය යුතුය.
(ඊ)	පොදු වෙළඳ සංකීර්ණයේ කඩ 19 ක් ගිවිසුම්ගත වීමකින් තොරව අවිධිමත්ව ව්‍යාපාර කර ගෙන යාමට ඉඩකඩ ලබා දී තිබුණි.	වෙනත් අයට පවරා දීමට කටයුතු කරන බව.	විධිමත්ව ගිවිසුම්ගත වීම කළ යුතු අතර නියමිත කුලිය අයකර ගත යුතුය.

3.2 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	නගර සභාව සතු එකතුව රු.8,009,373 ක වාහන 04 ක් වසර 06 ක කාලයක සිට නිෂ්ක්‍රීයව හෝ ඌණ උපයෝජිතය පැවතුණි.	වර්තමානයේ ට්‍රැක්ටර් භාවිතා නොකරන අතර, කම්පැක්ටරය අලුත්වැඩියාව සඳහා මුදා හළ යුතුය.	භාවිතයට ගැනීමට හෝ අපහරණය කිරීම කළ යුතුය.

(ආ)	පොදු වෙළඳ පොළ සංකීර්ණයේ කඩ කාමර 38 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් උපයෝජනය නොකර වසා දමා තිබුණි.	තක්සේරුව ලද පසු ටෙන්ඩර් කර ලබා දීමට කටයුතු කරන බව.	ටෙන්ඩර් පරිපාටි අනුගමනය කර කුලියට ලබා දීම කළ යුතුය.

3.3 වත්කම් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සභාව පරිහරණය කරන ඉඩම් 102 ක අයිතිය තහවුරු කර ගැනීම සඳහා මැනුම් කටයුතු සිදු කර නොතිබුණි.	මැනුම් කටයුතු කඩිනමින් සිදු කරන බව.	සභාව සතු දේපළ අයිතිය තහවුරු කර ගැනීම කළ යුතුය.
(ආ)	2020 වර්ෂයේ වත්කම් සමීක්ෂණය යටතේ හඳුනා ගෙන තිබුණු ඉඩම් හා ගොඩනැගිලි 235 ක් හා රු.4,394,000 ක බොබ්කැට් යන්ත්‍රයක අයිතිය පවරා ගෙන නොතිබුණි.	ඉදිරි ක්‍රියාමාර්ග සිදු කරන බව.	සභාව සතු දේපළ අයිතිය පවරා ගත යුතුය.

3.4 මානව සම්පත් කළමනාකරණය

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
අනුමත හා තථ්‍ය කාර්ය මණ්ඩලය සැසඳීමේ දී, තනතුරු 22 ක පුරප්පාඩු 79 ක් හා එක් තනතුරක අතිරික්ත 11 ක් පවතුණි. මෙම සේවක පුරප්පාඩු තත්ත්වය මහජන සේවාවන් කාර්යක්ෂමව පවත්වාගෙන යාමට දැඩි බලපෑමක් වී තිබුණි.	බඳවා ගැනීමට ඉදිරි කටයුතු සිදු කරමින් පවතින බව.	පුරප්පාඩු සම්පූර්ණ කර ගෙන මහජන සේවාවන් කාර්යක්ෂමව ඉටු කළ යුතුය.

3.5 වාහන පද්ධතිය කළමනාකරණය

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
සභාව සතුව පවතින වාහනයක් අභ්‍යන්තර අළුත්වැඩියාව සඳහා 2022 ජූනි 15 දින වාහන අලුත්වැඩියා කරන පෞද්ගලික ආයතනයක් වෙත ලබා දී, වසර 02 මාස 06 ක කාලයක් ගතව ඇතත්, එම අළුත්වැඩියාව සිදු කර නැවත නගර සභාවට භාර ගැනීමට කටයුතු කර නොතිබුණි.	අලුත්වැඩියා කටයුතු සිදු වෙමින් පවතින බව.	පසු විපරම් කර බලා අලුත්වැඩියාව කඩිනමින් සිදුකරවාගෙන භාවිතයට ගත යුතුය.